බන්ධ:කො:ජ: චක්‍ර ලේඛ අංක: 11 /2018

මගේ අංකය: කේ.03/51/ 02 /18,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2018.10. දින.

සියලුම බන්ධනාගාර අධිකාරීන් හා
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

## 2019 වසරට ආගමික වතාවත් සිදුකිරීම සඳහා පූජකවරුන් පත් කිරීම

සියළුම බන්ධනාගාර ආයතන වල රඳවන ලද සිර/සැක නේවාසිකයින් වෙනුවෙන් 2018 වර්ෂය සඳහා ආගමික වතාවත් සිදු කිරීම සඳහා පත්කරන ලද පූජකවරුන්ගේ දුරකාලය 2018.12.31 වෙනි දිනෙන් අවසන් වන හෙයින් , 2019 වර්ෂය සඳහා අළුතින් පූජකවරුන් පත් කිරීමට නියමිතව ඇත.

02. එසේ හෙයින් ඔබ ආයතනයේ හා ඊට අනුබද්ධ බන්ධනාගාර ආයතනවල රඳවා සිටින සියළුම කාන්තා සහ පිරිමි සිර / සැකකරුවන් හට ආගමික වතාවත් සිදුකිරීමට පහත සඳහන් කර ඇති ආකෘති පත්‍රයට අනුකූලව නිවැරදිව සැකසූ පූජකවරුන්ගේ නාමලේඛණයක් 2018.11.15 වෙනි දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

03. මෙම පූජකවරුන් පත්කිරීමේදී දැනට ආගමික වතාවත් සිදු කිරීමට පත් කර ඇති පූජකවරුන් විසින් ආයතනයේ නේවාසිකයින් වෙනුවෙන් අදාල වර්ෂය තුල හරියාකාරව නියමිත ආගමික කටයුතු සිදුකර තිබේද යන්න හා නේවාසිකයින් වෙනත් ආගම් වලට හැරවීම , බන්ධනාගාර පරිපාලනය විවේචනය වන පරිදි කටයුතු සිදුකර ඇත්ද යන කරුණු පිළිබඳව ඔබ විසින් පූර්ණ ඇගයීමක් සිදුකර සුදුසු පූජකවරුන්ගේ නම් ඇතුලත් වන පරිදි අදාල නාමලේඛණය සැකසීමට කටයුතු කල යුතුය.

04. තවද , දැනට පත්කර ඇති පූජකවරුන්ගෙන් තමන් නියෝජනය කරන ආගමට අනුකූලව නිසියාකාර සේවාවක් සිදුනොකරන බව හැඟේ නම් එම තත්වය පැහැදිලි කරදී අදාල පුද්ගලයින් හා සංවිධාන වල නම් ඉවත්කර අළුතින් පත්කරන සුදුසු පූජකවරුන්ගේ නම් පමණක් ඇතුලත් කල යුතුය. එසේ සිදුකරනු ලබන වෙනස් වීම් පිළිබඳව නිසියාකාරව සැකසූ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට පියවර ගන්න.

05. මෙම පූජකවරුන් පත්කිරීමට පෙර එතුමන්ලා නියෝජනය කරනු ලබන බෞද්ධ , කතෝලික / ක්‍රිස්තියානි (නිකායන්) , ඉස්ලාම් , හින්දු ආගම් වලට අයත් අදාල බන්ධනාගාර බල ප්‍රදේශයේ ප්‍රධාන නායක ස්වාමීන් වහන්සේ , බිෂොප් තුමා / ( ප්‍රධාන පියතුමෙක්) , ප්‍රධාන මව්ලවි පූජකතුමා , ප්‍රධාන කුරුක්කල් තුමාගෙන් ඔවුන් පත්කිරීම සම්බන්ධයෙන් එකගතාවය වෙන් වෙන් වශයෙන් ලිඛිතව ලබා ගැනීමට කටයුතු කර එම එකගතාවය සමග මා වෙත නියමිත නාමලේඛණය ඉදිරිපත් කල යුතුය.

06. එල්.ටී.ටී.ඊ නේවාසිකයින් රඳවන ලද ආයතන වල පූජකවරුන් තෝරා ගැනීමේදී එසේ තෝරාගනු පූජකවරුන් අයත් පොලිස් බල ප්‍රදේශයේ පොලිසිය මගින් පොලිස් වාර්තාවක් ලබාගෙන ඒ අනුව අදාල නම් ඇතුලත් කිරීම වඩාත් යෝග්‍ය වන බව දන්වන අතර , අදාල සෑම පූජකවරයෙකුම පත් කිරීමට පෙර නියමිත පූජකවරයා වර්ෂය පුරාම තම සේවාව අඛණ්ඩව ලබාදීමට හැකි අය සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී එක් එක් ආගමේ ප්‍රධාන පූජක තුමා සමග සාකච්ඡා කර මෙම තෝරාගැනීම සිදුකිරීමට පියවර ගත යුතුය.

මීට අමතරව ඔබගේ විශේෂ අවධානය යොමුකර ආයතනයේ **සිටින නේවාසිකයින් සංඛ්‍යාවට සරිලන ප්‍රමාණයට** ගැලපෙන පරිදි තෝරා ගනු ලබන පූජකවරුන්ගේ නම් ලැයිස්තුවක් පමණක් නියමිත දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

<u>2019 වර්ෂය සඳහා පූජකවරුන් පත් කිරීම</u>

......................................බන්ධනාගාරය

| බෞද්ධ | නේවාසික සංඛ්‍යාව | කතෝලික | නේවාසික සංඛ්‍යාව | ක්‍රිස්තියානි (නිකායන්) | නේවාසික සංඛ්‍යා | ඉස්ලාම් | නේවාසික සංඛ්‍යා | හින්දු | නේවාසික සංඛ්‍යා | වෙනත් | නේවාසික සංඛ්‍යා |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.